ප්‍රවෘත්ති අධ්‍යක්ෂ/ප්‍රවෘත්ති සංස්කාරක 2023 ජුනි 21

# ප්‍රවෘත්ති නිවේදනය

## ජාතික පාරිභෝගික මිල දර්ශකය (පදනම 2021 = 100) : 2023 මැයි

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය

දුරකථනය: 011-2147414 ෆැක්ස්: 011-2877945 ඊමේල්: prices@statistics.gov.lk

ජාතික පාරිභෝගික මිල දර්ශකයේ 2013=100 වූ දර්ශක යොමු කාලය 2023 ජනවාරි මාසයේ සිට 2021=100 වන නව දර්ශක යොමු කාලයට යාවත්කාලීන කර ඇත. ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මගින් ජාතික පාරිභෝගික මිල දර්ශකය මාසිකව නිකුත් කරනු ලබන අතර, 2023 මැයි මාසයේ ලක්ෂ්‍යමය මතුපිට උද්ධමනය (Headline Inflation) 22.1%ක් බව එහි අධ්‍යක්ෂ ජනරාල් මෙම නිවේදනය නිකුත් කරමින් සඳහන් කර ඇත. 2023 අප්‍රේල් මාසයේ ලක්ෂ්‍යමය මතුපිට උද්ධමනය 33.6%ක් ලෙස වාර්තා විය. 2023 මැයි මාසයේ උද්ධමනය සඳහා ආහාර කාණ්ඩයේ 7.3%ක හා ආහාර නොවන කාණ්ඩයේ 14.9%ක දායකත්වයක් පිළිවෙලින් ලබා දී ඇත. 2022 මැයි මාසයට සාපේක්ෂව 2023 මැයි මාසයේ උද්ධමනය වැඩිවීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ ආහාර හා ආහාර නොවන කාණ්ඩවල පැවති ඉහළ මිල මට්ටම් ය. කෙසේ වෙතත් ආහාර කාණ්ඩයේ වාර්ෂික උද්ධමනය(ලක්ෂ්‍යමය) 2023 අප්‍රේල් මාසයේදී 27.1% සිට 2023 මැයි මාසයේදී 15.8% දක්වා අඩුවූ අතර, ආහාර නොවන කාණ්ඩයේ වාර්ෂික උද්ධමනය(ලක්ෂ්‍යමය)2023 අප්‍රේල් මාසයේදී 39.0% සිට 2023 මැයි මාසයේදී 27.6% දක්වා අඩුවිය.

ජාතික පාරිභෝගික මිල දර්ශකයේ (2021=100) මාසික වෙනස්වීම සංසන්දනය කලවිට, 2023 අප්‍රේල් මාසයේ 202.7ක් වූ දර්ශකාංකය 2023 මැයි මාසයේ දී 203.1ක් දක්වා වැඩිවීමක් වාර්තා විය. පසුගිය මාසය හා සංසන්දනය කල විට 2023 මැයි මාසයේ දර්ශකාංකය 0.4ක වැඩිවීමක් එනම් 0.22ක ප්‍රතිශතාංක වැඩිවීමක් වාර්තා විය. මෙම මාසික වෙනස්වීමට ආහාර කාණ්ඩයේ දර්ශක අගය 0.45% කින් වැඩිවීම සහ ආහාර නොවන කාණ්ඩයේ දර්ශක අගය 0.23% කින් අඩුවීම දායක වී ඇත.

ආහාර කාණ්ඩය සැළකුවිට අළුත් මාළු, එළවළු, සීනි, කුකුළු මස්, මයිසූර් පරිප්පු, අර්තාපල්, ඉඟුරු, සුදුළූණු, ලොකුළූණු, දෙහි, කරවල සහ ටින්මාළු යන ආහාර ද්‍රව්‍යවල මිලෙහි වැඩිවීමක් ප්‍රධාන වශයෙන් වාර්තා වී ඇත. එහෙත් අළුත් පළතුරු, කිරිපිටි, සහල්, පොල්, මිරිස්කුඩු, පොල්තෙල්, සාමාන්‍ය පාන්, බිත්තර, අමුමිරිස්, වියළි මිරිස්, කහකුඩු, කවුපි සහ රතුළූණු යන ආහාර ද්‍රව්‍ය වල මිලෙහි අඩුවීමක් වාර්තා වී ඇත.

පසුගිය මාසය හා සංසන්දනය කලවිට, 2023 මැයි මාසයේ ආහාර නොවන කාණ්ඩයේ දර්ශක අගය අඩුවීම සඳහා 'මධ්‍යසාර පාන වර්ග, දුම්කොළ හා මත්ද්‍රව්‍ය' (*බුලත්විට*), 'නිවාස, ජලය, විදුලිය, ගෑස් හා වෙනත් ඉන්ධන' (*ගොඩනැගිලි ඉදිකිරීම් ද්‍රව්‍ය හා එල්.පී. ගෑස්*), 'ගෘහ උපකරණ හා ගෘහ ඒකක නඩත්තු කටයුතු', 'ප්‍රවාහන' (*පෙට්‍රල් සහ ඩීසල්*) සහ 'විවිධ භාණ්ඩ හා සේවා' (*සුවඳ සබන් වර්ග*) යන කාණ්ඩවලට අයත් අයිතමයන්ගේ මිල අඩුවීම ප්‍රධාන වශයෙන් බලපා ඇත. එහෙත් 'රෙදිපිළි හා පාවහන්' සහ 'විනෝදාත්මක හා සංස්කෘතික' යන කාණ්ඩවලට අයත් අයිතමයන්ගේ මිලෙහි වැඩිවීමක් වාර්තා වී ඇත. තවද පසුගිය මාසය හා සංසන්දනය කලවිට 'ආපනශාලා සහ හෝටල්' කාණ්ඩයට අයත් අයිතමයන්ගේ මිලෙහි ඉතා සුළු වැඩිවීමක් වාර්තා වී ඇත. එමෙන්ම 'සෞඛ්‍ය', 'අධ්‍යාපන', සහ 'සන්නිවේදන' කාණ්ඩ වලට අයත් අයිතමයන්ගේ මිල අප්‍රේල් මාසය පුරා නොවෙනස්ව පැවති බව වාර්තා වී ඇත.

ජාතික පාරිභෝගික මිල දර්ශකයේ (පාද වර්ෂය: 2021=100) ලක්ෂ්‍යමය වෙනස්වීම් පදනම්ව නිතර මිල උච්ඡාවචනය වන ආහාර වර්ග, බලශක්ති සහ ප්‍රවාහන අයිතමයන් ඉවත් කිරීමෙන් පිළිබිඹු වන යටිදැරි උද්ධමනය (Core Inflation), 2023 අප්‍රේල් මාසයේ 31.8% සිට 2023 මැයි මාසයේදී 21.6% දක්වා අඩුවීමක් වාර්තා විය.



ජාතික පාරිභෝගික මිල දර්ශකය (පදනම 2021=100), ජාතික පාරිභෝගික මිල දර්ශකය (යටිදැරි), ලක්ෂ්‍යමය මතුපිට උද්ධමනය සහ ලක්ෂ්‍යමය යටිදැරි උද්ධමනය - විචලනය

## ජාතික පාරිභෝගික මිල දර්ශකයේ විචලනය (පදනම : 2021 = 100)

| වර්ෂය | මාසය | දර්ශකාංකය | | | | දර්ශකාංකයේ මාසික වෙනස්වීම (%) | | ලක්ෂ්‍යමය උද්ධමනය (%) | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | ජා.පා.මි.ද. (මතුපිට) | | | ජා.පා.මි.ද. (යටිදැරි) | | | ජා.පා.මි.ද. (මතුපිට) | | | ජා.පා.මි.ද. (යටිදැරි) |
| | | සියළුම අයිතම | ආහාර | ආහාර නොවන | | ජා.පා.මි.ද. (මතුපිට) | ජා.පා.මි.ද. (යටිදැරි) | සියළුම අයිතම | ආහාර | ආහාර නොවන | |
| 2022 | මැයි | 166.3 | 195.3 | 147.6 | 154.5 | 9.6 | 8.2 | | | | |
| | ජූනි | 183.5 | 222.8 | 158.2 | 167.5 | 10.3 | 8.4 | | | | |
| | ජූලි | 193.1 | 233.4 | 167.1 | 176.8 | 5.2 | 5.6 | | | | |
| | අගෝ. | 197.7 | 237.5 | 171.9 | 181.2 | 2.4 | 2.5 | | | | |
| | සැප්. | 201.9 | 239.1 | 178.0 | 185.9 | 2.1 | 2.6 | | | | |
| | ඔක්. | 201.6 | 236.5 | 179.1 | 188.0 | -0.1 | 1.1 | | | | |
| | නොවැ. | 200.3 | 233.2 | 179.1 | 187.8 | -0.6 | -0.1 | | | | |
| | දෙසැ. | 200.4 | 232.4 | 179.8 | 188.0 | 0.0 | 0.1 | | | | |
| 2023 | ජන. | 201.8 | 232.8 | 181.8 | 189.8 | 0.7 | 1.0 | 53.2 | 53.6 | 52.9 | 52.0 |
| | පෙබ. | 204.1 | 228.1 | 188.6 | 189.4 | 1.1 | -0.2 | 53.6 | 49.0 | 57.4 | 50.1 |
| | මාර්තු | 204.8 | 223.2 | 193.0 | 188.1 | 0.3 | -0.7 | 49.2 | 42.3 | 54.9 | 44.2 |
| | අප්‍රේල් | 202.7 | 223.8 | 189.1 | 188.2 | -1.0 | 0.1 | 33.6 | 27.1 | 39.0 | 31.8 |
| | මැයි | 203.1 | 226.1 | 188.3 | 187.8 | 0.2 | -0.2 | 22.1 | 15.8 | 27.6 | 21.6 |

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව